**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** | **ශිල්ප කලා - I** | **කාලය පැය 3 යි**

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය සපයා ඇති පිළිතුරු පත්‍රයේ කතිරයකින් සටහන් කරන්න.

---

01. මිනිසාගේ සිතුම් පැතුම් අවශ්‍යතා මුල්කරගෙන ජනකලා බිහිවී ඇත. පහත දැක්වෙන ජනකලා අතුරෙන් දෘශ්‍යකලා ලෙස සැලකෙන ජනකලා කාණ්ඩය තෝරන්න.

(1) පැල්කවි, ගොයම් කවි, මැටි කර්මාන්තය.

(2) ලාක්ෂා කර්මාන්තය, පිත්තල කර්මාන්තය, ලී කැටයම් කර්මාන්තය

(3) පේෂ කර්මාන්තය, පතල් කර්මාන්තය, කෘෂි කර්මාන්තය

(4) වෙස් මුහුණු කර්මාන්තය, කරත්ත හා පාරු කර්මාන්තය

02. අරයන් දෙකකින් හා ඒ තුළ වූ චාපයකින් වෙන්වූ කොටස හඳුන්වන නම කුමක් ද?

(1) වෘත්ත ඛණ්ඩය නමිනි. (2) කේන්ද්‍රික ඛණ්ඩය නමිනි.

(3) ජ්‍යාය නමිනි. (4) වෘත්ත පාදය නමිනි.

03. මෙහි දැක්වෙන ජ්‍යාමිතික නිර්මාණය කුමක් ද?




(1) D ලක්ෂයේ සිට AB රේඛාවට ලම්භ සමච්ඡේදනයක් ඇඳීම.

(2) OD රේඛාවට ලම්භකයක් ඇඳීම.

(3) AB සරල රේඛාවේ මධ්‍ය ලක්ෂ්‍යයට ලම්භකයක් ඇඳීම.

(4) AB රේඛාවේ පිහිටි O ලක්ෂ්‍යයට ලම්භකයක් ඇඳීම.

04. රූප සටහනින් දැක්වෙන්නේ සමද්විපාද සෘජුකෝණී ත්‍රිකෝණයකි. එහි එක් කෝණයක අගය $90^0$ කි. ඉතිරි කෝණ දෙකේ අගය වන්නේ,




(1) $30^0, 60^0$ කි

(2) $45^0, 45^0$ කි

(3) $60^0, 45^0$ කි

(4) $50^0, 40^0$ කි

05. පහත රූප සටහනෙන් දැක්වෙන නිර්මාණය කුමක් ද?




(1) පංචාස්‍රයක් නිර්මාණය කිරීම.

(2) වෘත්තයක් සමකොටස් වලට බෙදීමයි.

(3) පාදයක දිග දී තිබෙන විට ෂඩාස්‍රයක් නිර්මාණය කිරීමයි.

(4) වෘත්තයක් තුළ ඕනෑම බහුඅස්‍රයක් ඇඳීමයි.

06. පහත රූප සටහනින් දැක්වෙන්නේ ජ්‍යාමිතික ඝන රූපයක විකසනයකි. එම ජ්‍යාමිතික ඝන රූපය වන්නේ,




(1) කේතුව
(2) ඝනකය
(3) ඝනකාභය
(4) සිලින්ඩරය

07. රූප සටහනින් දක්වා ඇත්තේ ඉලිප්සයක් නිර්මාණය කරන ආකාරයයි. එම ක්‍රමය වන්නේ,




(1) වෘත්ත ක්‍රමයයි.
(2) චාප ක්‍රමයයි.
(3) ඍජු ප්‍රක්ෂේපණ ක්‍රමයයි.
(4) ඒක කේන්ද්‍රික වෘත්ත ක්‍රමයයි.

08. විධිමත් ලෙස බහු අස්‍රයක් නිර්මාණය කිරීමේ ක්‍රම දෙකක් භාවිතා කෙරේ. එනම්,

(1) ප්‍රක්ෂේපණ ක්‍රමය, විකසන ක්‍රමය
(2) පොදු ක්‍රමය, විශේෂ ක්‍රමය
(3) තිරස් ක්‍රමය, සිරස් ක්‍රමය
(4) චාප ක්‍රමය, ඍජුකෝණාස්‍ර ක්‍රමය

09. සවිධි පංචාස්‍රාකාර හැඩැති බෝලයක් නිර්මාණය කිරීමට අවශ්‍ය පතරොම් කැබලි ගණන කීයද?

(1) පහකි. (2) හයකි. (3) දහයකි. (4) දොළහකි.

10. පහත දැක්වෙන රේඛා වර්ග දෙක ජ්‍යාමිතික නිර්මාණ වලදී භාවිතවේ. එම භාවිත අවස්ථා වන්නේ,



(1) ඡේදනය වන ස්ථාන දැක්වීම සඳහාත් සැඟිදාර දැක්වීම සඳහා.
(2) මධ්‍ය අක්ෂය හෝ සමමිතික බව දැක්වීමට, ඡේදනය වන ස්ථාන දැක්වීම සඳහා.
(3) වස්තුවක පෙනෙන දාර දැක්වීම, ඡේදනය කළ යුතු ස්ථානදැක්වීම සඳහා.
(4) වස්තුවක පෙනෙන දාර දැක්වීම, මධ්‍ය අක්ෂය සමමිතික බව දැක්වීම සඳහා

11. තාප බන්ධිත ක්‍රමයට රෙදි පිළි අලංකාර කිරීමේදී මෝස්තර තබා අලවා ගැනීමට වෙළඳපලෙන් මිලදී ගත යුතු කඩදාසියේ වර්ණ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) රතු, නිල් ය. (2) දම්, නිල් ය. (3) රතු, දම් ය. (4) කහ, රතු ය.

12. තිර රාමු මුද්‍රණයේ දී මුද්‍රණතලය මතට මෝස්තරය ලබාගත හැකි ක්‍රම ඇතුළත් පිළිතුර තෝරන්න.

A - තිරය මත මෝස්තර ඇඳීම.
B - මෘදු කඩදාසියක සකස්කළ සිදුරු පතක් තිරය මත අලවා ගැනීම.
C - ආලෝක සංවේදී ක්‍රමය.
D - සායම් ආලේපනය.

(1) ABD (2) BCD (3) CDA (4) ABC

13. සායම් පෙවීම මගින් රෙදිපිළි අලංකාරකරගත හැකි ක්‍රම ඇතුළත් පිළිතුරු කාණ්ඩය වන්නේ,

(1) ගැටපඬු ක්‍රමය, බතික් ක්‍රමය
(2) අච්චු මුද්‍රණය, ස්ටෙන්සිල් මුද්‍රණය
(3) ගැටපඬු ක්‍රමය, අච්චු මුද්‍රණය
(4) බතික් ක්‍රමය, ස්ටෙන්සිල් මුද්‍රණය

14. බතික් කිරීමේදී යොදාගන්නා ඉටි මිශ්‍රණය සඳහා යොදාගන්නා ද්‍රව්‍ය වන්නේ,

(1) පැරපින් ඉටි, මී ඉටි, බයින්ඩර්ගම්
(2) පැරපින් ඉටි, මී ඉටි, රට දුම්මල
(3) පැරපින් ඉටි, රට දුම්මල, ටර්පන්ටයින්
(4) පැරපින් ඉටි, රට දුම්මල, ලුණු

15. බතික් මෝස්තර සඳහා යෙදූ ඉටි ඉවතිරීම සඳහා කළහැකි පහසුම ක්‍රමය වන්නේ,
(1) ඇල්දියෙන් සේදීම (2) පවනේ වේලීම
(3) හුමාලයෙන් තැම්බීම (4) උණු ජලයෙන් සේදීම

16. අංක $10^s$ තනිපට නූලක් දෙපට අඹරාගත් විට එහි අංකය $2/10^s$ වේ. ඒ අනුව කිලෝග්‍රෑම් 1 කට අල්ලන නූල් කැරලි ගණන කීයද?
(1) 10 කි. (2) 20 කි. (3) 5 කි. (4) 15 කි.

17. සෙ.මී. දික්නූල් 30 ක් ඇති ඇඳ රෙදි හැදයක පළල සෙ.මී. 50 කි. හැදයේ දික්නූල් ප්‍රමාණය සොයන්න.
(1) 3000 කි. (2) 2000 කි. (3) 1000 කි. (4) 1500 කි.

18. මේස යන්ත්‍රයෙන් වියාගත හැකි රෙදි වර්ග සහිත පිළිතුර ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) සාරි, සරොම්, ඇඳ රෙදි (2) මේස දරණු, ඉනපටි, ලේන්සු
(3) තුවා, සරොම්, සාරි (4) කමිස, තුවා, සරොම්

19. පහත වියමන් රටාව හඳුන්වන නාමය වන්නේ,



(1) කඩහීරි වියමන
(2) රළ හීරි වියමන
(3) සරල හීරි වියමන
(4) තුඩු හීරි වියමන

20. විවීමේ යන්ත්‍රයක පුඩුවැල් පේළි වලින් කෙරෙන කාර්යය වන්නේ,
(1) රටාවට අනුව නූල් ඇදීම (2) නූල් කෙළින් තබා ගැනීම
(3) හුස්නූල් තදකර ගැනීම (4) නූල් කැඩීම වළක්වා ගැනීම

21. යකඩ ප්‍රතිශතය ඉතාමත් සුළු වශයෙන් අඩංගු පැහැදිලි සුදු වර්ණයෙන් යුත් පිළිස්සීමෙන් පසුද එම පැහැය ලැබෙන මැටි වර්ගය වන්නේ,
(1) රතු මැටි (2) බෝල මැටි (3) තලප මැටි (4) කෙඹලින් මැටි

22. මැටිවල භෞතික හා රසායනික ගුණ අතර ජලය උරා ගැනීමේ හැකියාව ලැබෙන සේ සිදුරු සහිත බව හඳුන්වන්නේ,
(1) සුවිකාර්යතාවයි (2) හැකිලීමයි (3) සවිවරතාවයයි (4) නම්‍යතාවයයි

23. මැටි නිධි පිහිටි ස්ථාන අනුව වර්ග කරයි. කොච්චි කඩේ, අලුත් නුවර පිහිටි මැටි නිධි අයත් වන්නේ,
(1) අන්තර් කලාපීය මැටි නිධිය (2) වියළි කලාපීය මැටි නිධිය
(3) තෙත් කලාපීය මැටි නිධිය (4) මධ්‍යම කලාපීය කලාපීය මැටි නිධිය

24. ෆෙල්ස්පාර්, ක්වාට්ස්, ඩොලමයිට්, සිලිකා, ග්‍රොග් ආදී නොඇලෙන සුළු අමුද්‍රව්‍ය කුඩුකර ගැනීම සඳහා භාවිතා කරන යන්ත්‍රය වන්නේ,
(1) පග්මිල් යන්ත්‍රය (2) බෝල් මිල් යන්ත්‍රය (3) රෝලර් ක්‍රෂර් යන්ත්‍රය (4) ජෝ ක්‍රෂර් යන්ත්‍රය

25. වාත්තු මැටි දියරය සකස්කිරීමේදී ඇලෙන සුළු අමුද්‍රව්‍ය හා නො ඇලෙන සුළු අමුද්‍රව්‍ය අනුපාතිකව යොදා අඹරා ගනියි. මෙම දියරයේ දුස්ස්‍රාවිතාව සඳහා (දියර ගතිය ඇති කිරීම) යොදා ගන්නා ද්‍රව්‍ය වන්නේ,
(1) සෝඩියම් සිලිකේට් (2) සෝඩියම් බයි කාබනේට්
(3) සෝඩියම් ඩයොක්සයිඩ් (4) සිලිකන් ඩයොක්සයිඩ්

26. සෙන්ටිග්‍රේඩ් අංශක $1650^0$ ක් පමණ අධික උෂ්ණත්වයකට ඔරොත්තු දීමේ හැකියාව ඇති මැටි වර්ගය වන්නේ,
(1) රතු මැටි (2) ගිනි මැටි (3) බෝල මැටි (4) කෙඹලින් මැටි

27. මැටි තහඩු භාවිතයෙන් කැටයම් කිරීමේදී මැටි තහඩුවේ අඩක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හාරා මතුකර ගන්නා කැටයම් ක්‍රමය වන්නේ,
(1) අල්ප උන්නත කැටයම් (2) අර්ධ උන්නත කැටයම්
(3) පූර්ණ උන්නත කැටයම් (4) අධි උන්නත කැටයම්

28. ප්ලාස්ටර් ඔෆ් පැරිස් අච්චුවකට වාත්තු මැටි දියර එක්කර මඳ වේලාවක් ඝනවීමට තබා ඉතිරි මැටි දියර ඉවත්කර භාණ්ඩ සාදාගන්නා ක්‍රමය වන්නේ,
(1) ඝන වාත්තු ක්‍රමය (2) ඇඹීමේ ක්‍රමය (3) අච්චු ක්‍රමය (4) කුහර වාත්තු ක්‍රමය

29. මැටි භාණ්ඩ අලංකරණ ක්‍රම අතර ග්ලේස් යෙදීම හෙවත් දිස්න දැමීම කරනු ලබන්නේ කුමන අවස්ථාවේ ද?
(1) පිළිස්සීමට පෙර වියළි අවස්ථාවේ
(2) නිෂ්පාදන අවස්ථාවේ
(3) පළමු පිළිස්සීමෙන් පසු අවස්ථාවේ
(4) හම්පදම් අවස්ථාවේ

30. මනාලියන් සඳහා මල් කළඹක් සකස් කිරීමේදී සැලකිය යුතු කරුණු අතර ප්‍රධාන තැනක් ගන්නේ,
(1) මනාලියගේ මංගල ඇඳුමට ගැලපීම හා ශරීරයේ ලක්ෂණ අනුව තෝරා ගැනීම.
(2) මංගල අඳුමේ වර්ණය හා මනාලයාගේ කැමැත්ත අනුව.
(3) මනාලයාගේ ඇඳුමේ වර්ණය හා ශරීර ලක්ෂණ අනුව.
(4) මනාලියගේ ශරීර වර්ණය හා ඇඳුමේ වර්ණය අනුව.

31. සෙල්ලම් සතුන් නිර්මාණයේ දී විශේෂයෙන් පළමුව කළයුතු කාර්ය වන්නේ,
(1) රෙදි කපා ගැනීම
(2) පතරොම සකස්කිරීම
(3) පැඩිං පිරවීම
(4) කපාගත් රෙදි මසා ගැනීම

32. රෙදි බෝනික්කා නිර්මාණයේදී කැබලි මූට්ටු කිරීම මහන යන්ත්‍රය මඟින් මෙන්ම අතින් මැසීමද සිදුකරයි. අතින් මැසීමේදී මූට්ටු කිරීම සඳහා යොදා ගන්නා මැහුම් ක්‍රමය වන්නේ,
(1) පිස්මේන්තු මැස්ම
(2) ප්‍රංශ ගැට මැස්ම
(3) බුලියන් මැස්ම
(4) දම්වැල් මැස්ම

33. සැහැල්ලු සෙල්ලම් සතුන් නිර්මාණය කිරීම සඳහා වඩාත් සුදුස රෙදි වර්ගය කුමක් ද?
(1) වෙල් බෝවා, බෝවා, ෆෙල්ට්
(2) පොප්ලින්, බෝවා, නයිලෝන්
(3) නයිලෝන්, පොප්ලින්, බෝවා
(4) සේද, ලෝම, විස්කෝස්

34. කඩදාසි භාවිතාකර ඩේලියා මලක් සෑදීමේදී මල් පෙත්තේ හැඩය ලබාගැනීමට අනුගමනය කරන සරල ක්‍රමය වන්නේ,
(1) ගම් ගා අලවා ගැනීම
(2) ඉටි ගැල්වීම
(3) ටූල් කිරීම
(4) කැඳ දැමීම

35. කඩදාසි භාවිතයෙන් සාදන මල් වල කල්පැවැත්ම හා වර්ණය ඒ අයුරින්ම පවත්වා ගැනීමට කළ හැකි කාර්ය වන්නේ,
(1) වතුරේ ගිල්වා තැබීම
(2) පැරපින් ඉටි ගල්වා තැබීම
(3) බයින්ඩර් ගම් ගෑම
(4) වාර්නිෂ් ගෑම

36. ප්ලාස්ටර් ඔෆ් පැරිස් භාවිතාකර සාදන ලද නිර්මාණයක් වර්ෂාවෙන් හා හිරු එළියෙන් ආරක්ෂා කර ගැනීම සඳහා කළයුතු කාර්යය වන්නේ,
(1) වෙදර් ෂීල් හෝ ලැකර් ආලේප කිරීම
(2) බයින්ඩර් ගම් ආලේප කිරීම
(3) ඉටි ගැල්වීම
(4) ජලයේ පොඟවා තැබීම

37. පේපර් ක්විලින් නිර්මාණ කිරීම තුළින් බොහෝ වාසි ලැබේ. පහත පිළිතුරු අතරින් වාසියක් නොවන්නේ,
(1) නිර්මාණ කුසලතා වැඩිදියුණු වීම.
(2) ආර්ථික වාසි ලැබීම.
(3) කාලය ප්‍රයෝජනවත් ලෙස ගතකිරීම.
(4) කාලය අපතේ යාම.

38. මුද්‍රිත පොතක ඇති රූප සටහනක් රෙදි කැබැල්ලක් මතට පිටපත් කර ගැනීමේ පහසුම ක්‍රමය කුමක් ද?
(1) අතින් ඇඳීම
(2) සන්නාලි කාබන් කඩදාසියක් රෙද්ද මත තබා ඇඳීම
(3) මුද්‍රණයකර අලවා ගැනීම
(4) පින්තූරය කපා අලවා ගැනීම

39. සෙරමික් කර්මාන්තයේ දී අච්චු නිර්මාණය සඳහා ප්ලාස්ටර් ඔෆ් පැරිස් භාවිත කරයි. අච්චු සඳහා වඩාත්ම සුදුසු ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිපදවන රටවල් වන්නේ,
(1) එංගලන්තය හා තායිලන්තය
(2) ඉන්දියාව හා ශ්‍රී ලංකාව
(3) පකිස්ථානය හා ඉන්දියාව
(4) ඉන්දියාව හා එංගලන්තය

40. උද්‍යාන මූර්ති නිර්මාණයේ දී කඩදාසි පල්ප යොදාගෙන නිර්මාණ සිදු කරයි. නිර්මාණය කෘමි සතුන්ගෙන් ආරක්ෂා කරගැනීම සඳහා අඹරාගත් කඩදාසි පල්පයට එක්කළ යුතු ද්‍රව්‍ය වන්නේ,
(1) කරාබු නැටි තෙල් හා ලින්සීඩ් ඔයිල්
(2) පල්මානික්කම් හා බයින්ඩර් ගම්
(3) බයින්ඩර් ගම් හා කපුරු කුඩු
(4) භූමිතෙල් හා පොල්තෙල්

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **ශිල්ප කලා - II** **කාලය පැය 2 යි**

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01) ඔබ විද්‍යාලයේ පැවැත්වෙන ත්‍යාග ප්‍රධානෝත්සවය ලබන මස දිනක පැවැත්වීමට තීරණය කර තිබේ. පරිසරයට මුල් තැන දෙමින් උත්සවයේ සියලුම සැරසිලි කටයුතු කිරීමට සංවිධායක මණ්ඩලය තීරණය කර තිබුණි.

i. විද්‍යාලයේ පිවිසුම් දොරටුවේ සාදන තොරණ සඳහා යොදාගත හැකි ස්වභාවික අමුද්‍රව්‍ය 04 ක් ලියන්න.

ii. තොරණ නිර්මාණය කිරීමට සුදුසු දළ රූපසටහනක් ඇඳින්න.

iii. උත්සව ශාලාව ස්වභාවික මල්වලින් අලංකාර කිරීමට සුදුසු ස්ථාන 02 ක් නම් කරන්න.

iv. උත්සව ශාලාවේ තැනින් තැන ජ්‍යාමිතික හැඩ සහිත පාපිසි තැබීමට තීරණය කරන ලදී. ඒ සඳහා සුදුසු ජ්‍යාමිතික හැඩතල 04 ක් අඳින්න.

v. බිත්ති සැරසිලි සඳහා ස්වභාවික ශාක පත්‍ර භාවිතයෙන් කළ නිර්මාණ තැබීමට යෝජිතය. ඒ සඳහා සුදුසු වියමන් රටා දෙක මතුපිට පෙනුම අඳින්න.

vi. උත්සව ශාලාවේ වේදිකාව දෙපස මැටි මාධ්‍ය යොදා ස්වභාවික අමුද්‍රව්‍ය භාවිතයෙන් අලංකාර කළ පුන්කලස් 02 ක් තැබීමට තීරණය කරන ලදී. අලංකාර කරන ලද පුන් කලස් දෙකක රූප සටහන් අඳින්න.

vii. ඉහත ඔබ අඳින ලද පුන්කළස් දෙක අලංකාර කිරීමට යොදාගත හැකි ස්වභාවික අමුද්‍රව්‍ය 04 නම් කරන්න.

viii. උත්සව ශාලාවේ තැබීමට සුදුසු උද්‍යාන අලංකරණ නිර්මාණ 02 ක් නම් කරන්න.

ix. ඉහත ඔබ නම් කළ උද්‍යාන අලංකරණ නිර්මාණවලට යොදා ගෙන තිබූ ස්වභාවික අමුද්‍රව්‍ය 02 ක් නම් කරන්න.

x. තෑගි තබන සිසුන්ට සිහිවටනයක් ලෙසින් බෑගයක් ප්‍රදානය කිරීමට නියමිතය. බෑගයට සුදුසු ජ්‍යාමිතික හැඩති ආකෘතියක් නිර්මාණය කරන්න.

(ලකුණු 2x10=20)

(02) ශිල්ප කලා විෂය හදාරණ සිසුන්ට විවිධ ආකාරයේ නිර්මාණ කිරීම සඳහා ජ්‍යාමිතික හැඩතල ඇඳීමට සිදුවේ.

i. 11 වසර සිසුන් වෘත්ත ආශ්‍රයෙන් අලංකාර මල් නිර්මාණය කර තිබුණි. වෘත්තයක කොටස් 04 ක් නම් කරන්න. (ල.02)

ii. වෙසක් කූඩුවක් නිර්මාණය කිරීමට සුදුසු සවිධි ෂඩාස්‍රයක් නිර්මාණය කරන්න. (ල.04)

iii. සිලින්ඩරාකාර හැඩයට නිර්මාණය කළ බෝනික්කකුගේ ආකෘතියක් පහත දක්වේ. එම බෝනික්කාගේ අතක, පාදයක, කඳට අයත් කොටස්වල විකසන වෙන වෙනම අඳින්න. (ල.04)



(03) රෙදිපිළි නිෂ්පාදනය සඳහා යොදා ගැනෙන ප්‍රධාන අමුද්‍රව්‍ය වන්නේ කෙඳිය. කෙඳි ස්වභාවික හා කෘත්‍රිම වශයෙන් ප්‍රධාන වර්ග 02 කි.

i. ලෝම කෙඳි ලබා ගැනීම සඳහා ඔටු පවුලට අයත් සත්ව වර්ග 04 ක් නම් කරන්න. (ල.02)

ii. ඛනිජ වලින් ලබා ගන්නා කෙඳි වර්ග නම්කර කාර්මික හා විදුලිකටයුතුවල නියලෙන්නන් සඳහා විශේෂයෙන් එම රෙදි භාවිතා කිරීමට හේතු මොනවා ද? (ල.04)

iii. ස්ටෙන්සිල් මුද්‍රණය සඳහා අවශ්‍ය ස්ටෙන්සිල් එක සාදා ගන්නා ආකාරය විස්තර කරන්න. (ල.04)

(04) මැටි භාණ්ඩ නිෂ්පාදනය, ගබඩා කිරීම, අලංකරණය මැටි කර්මාන්තයේ ප්‍රධාන කාර්යන් කිහිපයකි.

i. මැටි කර්මාන්තයේදී භාවිතා කරන සකපෝරු වර්ග 02 ක් නම් කරන්න. (ල.02)

ii. මැටි පෙට්ටියේ මැටි ගබඩාකරන ආකාරය ලියා එහි හරස්කඩ පෙනුම ඇඳ දක්වන්න. (ල.04)

iii. සරල අච්චුවකින් භාණ්ඩයක් සාදාගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ල.04)

(05) ඇඳුම් මිනිසාගේ මූලික අවශ්‍යතාවයකි.

i. නූල් දික් ගැසීමේ උපකරණ කට්ටලයට අයත් උපකරණ නම් කරන්න. (ල.02)

ii. වාම් වියමන් ප්‍රභේදයේ හා හීරි වියමන් ප්‍රභේදයේ දැකිය හැකි ප්‍රධාන වියමන් 04 ක් නම් කරන්න. (ල.04)

iii. පහත දක්වා ඇත්තේ හැදයක විස්තරයකි. හැදයේ දිග 50m කි. 1cm දික් නූල් 60 කි. හැදයේ පළල 30cm කි. දික් නූල් අංක $40/2^{s}$ වේ. හැදයට අවශ්‍ය දික් නූල් බර සොයන්න. (ල.04)

(06) විසිතුරු අත්කම් නිර්මාණ කලාව වර්තමානයේ ප්‍රධාන ස්වයං රැකියා මාර්ගයක් ලෙස ප්‍රචලිතය.

i. කතිර මැස්ම යොදා ගනිමින් බිත්ති සැරසිල්ලක් මසා ගැනීමට සුදුසු රෙදි වර්ග 02 නම් කරන්න. (ල.02)

ii. රෙදි කැබලි ආශ්‍රිතව ඔබ කැමති සුරතල් සතෙකු නිර්මාණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ලැයිස්තුවක් සාදා එය මසා නිමකර ගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ල.04)

iii. පේපර් ක්විලින් ආශ්‍රිතව බිත්ති සැරසිල්ලක් නිර්මාණය කර ගන්නා ආකාරය මූලික පියවර අනුව විස්තර කරන්න. (ල.04)

(07) පොදු උයන්වතු මෙන්ම තම කුඩා ගෙවත්තද අලංකාර උයනක් කර ගැනීමට ගන්නා උත්සාහය වර්තමානයේ දැකිය හැකි විශේෂයකි.

i. මැටි භාණ්ඩ හම් පදම් අවස්ථාවේ අලංකරණ ක්‍රම 04 ක් නම් කරන්න. (ල.02)

ii. බිතු කැටයම් හෙවත් මියුරල් නිර්මාණ වර්තමානයේ ඉතා ජනප්‍රිය කලාවකි. බිතු කැටයමක් සඳහා සුදුසු මෝස්තරයක් අඳින්න. (ල.04)

iii. සිමෙන්ති මාධ්‍යයෙන් හොඳ නිමාවක් සහිත මූර්තියක් නිර්මාණය කරගන්නා ආකාරය පියවර ලෙස ලියන්න. (ල.04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (2 ) | 02. (2 ) | 03. ( 3) | 04. (2 ) | 05. ( 3 ) | 06. ( 4 ) | 07. ( 3 ) | 08. (2 ) | 09. ( 4 ) | 10. ( 4 ) |
| 11. (3 ) | 12. (4 ) | 13. ( 1) | 14. (2 ) | 15. ( 4 ) | 16. ( 2 ) | 17. ( 4 ) | 18. (2 ) | 19. ( 4 ) | 20. ( 1 ) |
| 21. (4 ) | 22. (3 ) | 23. ( 1) | 24. (4 ) | 25. ( 1 ) | 26. ( 2 ) | 27. ( 4 ) | 28. (4 ) | 29. ( 3 ) | 30. ( 1 ) |
| 31. (2 ) | 32. (1 ) | 33. ( 1) | 34. (3 ) | 35. ( 2 ) | 36. ( 1 ) | 37. ( 4 ) | 38. (2 ) | 39. ( 1 ) | 40. ( 1 ) |

## II පත්‍රය

(01) i. ගොක් කොළ, පොල් කොළ, තල් කොළ, ඉරටු, මටළු ආදිය

ii. අදාළ රූප සටහනක් ඇඳ ඇත්නම් ලකුණු ලබාදෙන්න.

iii. නිවේදක පුවරුව, පිවිසුම් දොරටුව, පහන, වේදිකාව ආදිය

iv. අදාළ ජ්‍යාමිතික හැඩ ඇඳ ඇත්නම් ලකුණු ලබාදෙන්න.

v. වියමන රටා 02 ක් ඇඳ ඇත්නම් ලකුණු ලබාදෙන්න.

vi. රූප සටහන් ඇඳ ඇත්නම් ලකුණු ලබාදෙන්න.

vii. මල්, පොල්, පොල්මල්, පුවක් මල්, ක්‍රෝටන්, ගොක්කොල ආදිය

viii. මූර්ති, කැටයම්, පුන්කලස් ආදිය

ix. ගල්, මැටි, ලී ආදිය

x. සුදුසු ආකෘතියක් ඇඳ ඇත්නම් ලකුණු ලබාදෙන්න.

(ලකුණු 2x10=20)

(02) i. ජ්‍යාය, පරිධිය, කේන්ද්‍රය, වෘත්ත පාදය, කේන්ද්‍රික ඛණ්ඩය ආදී (ල.02)

ii. නිවැරදිව නිර්මාණය කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල.04)

iii. නිවැරදි මිනුම් සහිත විකසන සඳහා ලකුණු ලබාදෙන්න. (ල.04)

(03) i. උලමා, ඇල්පකා, විකුණා, ඔටුවා (ල.02)

ii. රන්, රිදී, වීදුරු, ඇස්බැස්ටෝස් - තාපයට ඔරොත්තු දීම, ගිනි නොගැනීම, අම්ලයන්හි දිය නොවීම. (ල.04)

iii. ස්ටෙන්සිල් තහඩුව සකස් කර ගන්නා ආකාරය විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල.04)

(04) i. පා සකපෝරුව, අත් සකපෝරුව, විදුලි සකපෝරුව (ල.02)

ii. 1. පදම් කරගත්තොත් මැටි භාණ්ඩ නිෂ්පාදනයට ගැනීම සඳහා ගුලි වශයෙන් මැටි පෙට්ටියේ අසුරනු ලැබේ.

2. මැටි පෙට්ටියේ හරස්කඩ පෙනුමක් ඇඳ ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල.04)

iii. තනි පලුව හෝ පලු දෙකක් භාණ්ඩයක් සාදා ගන්නා ආකාරය ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

(05) i. දික් නූල්, කුරු රාක්කය, නූල් බෙත්ම, නූල් බෙරය (ල.02)

ii. චාම් වියමන / ජටා වියමන / දික්දාර වියමන / හරස්දාර වියමන / සරලහීරි වියමන / දඟරහීරි වියමන / රළහීරි වියමන / රූචිත හීරි වියමන (ල.04)

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

iii. $= \dfrac{\text{හැදයේ දිග x පළල සෙ.මී. දික්නූල්}}{\text{1000 x නූලේ නොම්මරය}}$ (ල.04)

$= \dfrac{50 \times 30 \times 60 \times 2}{1000 \times 40}$

$= \dfrac{9}{2} = 4\dfrac{1}{2}$ kg

(06) i. අයිඩා රෙදි, පොප්ලින් (ල.02)

ii. ද්‍රව්‍ය හා උපකරණ :- සෞඛ්‍යයට හිතකර විවිධ වර්ණයේ රෙදි කැබලි, නූල් වර්ග, සුදුසු පිරවුම් මාධ්‍ය පතරොම සැකසීමට ඕන කඩදාසි, සන්නාලි කාබන් කඩදාසි, සවිකොළ, රිබන්, ඇස් කට නාසය සඳහා විවිධ ද්‍රව්‍ය, ඉදිකටු, කතුරු, මිණුම් පටි, දූතිරෝදය, පැන්සල, අඩිකෝදුව ආදිය (ල.04)

iii. තීරු පටි කපා ගැනීමේ අවස්ථාවේ සිට සැකසූ නිර්මාණය නිමාවක් ලබාදීම දක්වා පියවර වශයෙන් විස්තර කර තිබීම. (ල.04)

(07) i. කැටයම්, සිරමි, මුද්‍රා, මැටි දරණු, පේකඩ, ගුරුගල් ආදිය (ල.02)

ii. සුදුසු මෝස්තරයක් ඇඳ ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල.04)

iii. සිමෙන්ති මාධ්‍යකින් මූර්තියක් නිර්මාණයක් කරගන්නා ආකාරය දක්වා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල.04)